කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

**දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2023

2025 සැප්තැම්බර් / ඔක්තෝබර්

මානවශාස්ත්‍ර පීඨය

# වාග්විද්‍යාව

(නව නිර්දේශය)

වාක්‍ය විචාරය, අර්ථ විචාරය, සමාජවාග්විද්‍යාව සහ භාෂා සැලසුම්කරණය

# LING 28224

එක් කොටසකින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක්වත් ඇතුළත් වන සේ ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 12 යි. කාලය : පැය 03 යි.

---

## I කොටස - වාක්‍ය විචාරය

01. වාක්‍යයක් හුදෙක් වචන අනුපිළිවෙළක් ලෙස සැලකිය නොහැක්කේ ඇයි? සුදුසු උදාහරණ සමඟ පැහැදිලි කරන්න.

02. වාක්‍යයක් තුළ ඇති වචන ව්‍යාකරණ ප්‍රවර්ග මගින් අන්තර් සම්බන්ධිත වන්නේ කෙසේ ද? සිංහල හෝ ඉංග්‍රීසි භාෂාවෙන් අවම වශයෙන් ව්‍යාකරණ ප්‍රවර්ග තුනක් හෝ යොදා ගනිමින් සාකච්ඡා කරන්න.

03. වාක්‍ය විචාරාත්මක විශ්ලේෂණ සඳහා භාෂාවක පාද හඳුනා ගැනීම අත්‍යවශ්‍ය වන්නේ ඇයි? විවේචනාත්මකව පරීක්ෂා කරන්න.

## II කොටස - අර්ථ විචාරය

04. අර්ථ ඒකක හඳුන්වා අර්ථ විචාරයෙහි ලා වාක්‍යය හා වාගාලාපය වැදගත්වන ආකාරය පැහැදිලි කරන්න.

05. ප්‍රකරණය හඳුන්වා 'කාලවාචී' සහ 'ස්ථානවාචී' ආදේශක වචන ප්‍රකරණබද්ධව අර්ථවත් වන ආකාරය විස්තර කරන්න.

06. ''භාෂණ ක්‍රියා' යනු භාෂණය හා ක්‍රියාව මිශ්‍ර වීමකි.' සාකච්ඡා කරන්න.

## III කොටස - සමාජවාග්විද්‍යාව

07. භාෂාව හා සංස්කෘතිය අතර පවත්නා සම්බන්ධය සමාජවාග්විද්‍යාත්මක දෘෂ්ටි කෝණයෙන් විග්‍රහ කරන්න.

08. භාෂා ද්විරූපතාවෙහි කාර්යයමය වෙනස සිංහල භාෂාව ඇසුරෙන් පැහැදිලි කරන්න.

09. ඔබ කැමති ආගමික ප්‍රාස්තාවික භාෂාවක් ඇසුරින් සමාජවාග්විද්‍යාත්මක විශ්ලේෂණයක් කරන්න.

## IV කොටස - භාෂා සැලසුම්කරණය

10. භාෂා ව්‍යූහ-සැලසුම්කරණය පිළිබඳ විග්‍රහයක් කරන්න.

11. භාෂා-තත්ත්ව සැලසුම්කරණය පිළිබඳ විග්‍රහයක් කරන්න.

12. මහා පරිමාණ, මධ්‍ය පරිමාණ, සුලු පරිමාණ භාෂා සැලසුම්කරණ උදාහරණ සහිතව හඳුන්වා දෙන්න.

*******************************